Past Papers Wiki

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

※ A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

### A කොටස

1. (i) දහ අට සන්නිය **හෙවත්** සන්නියකුම් යාගය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 03 යි.)

(ii) සන්නියකුම් යාගයේ ප්‍රබල නාට්‍යමය අවස්ථාවක් තෝරාගෙන එය නාට්‍යමය වන්නේ කවර කරුණු නිසා දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

(iii) සන්නියකුම් යාගය හාස්‍යෝත්පාදක නාට්‍යයක ස්වරූපය ගන්නා බව පැවසෙන දයානන්ද ගුණවර්ධනගේ අදහස හා ඔබ එකඟ වන්නේ ද? සාකච්ඡාවක් ගොඩනගන්න. (ලකුණු 07 යි.)

2. (i) සොකරි නාටකය රඟ දැක්වීමේ අරමුණු **තුනක්** පෙන්වාදෙන්න. (ලකුණු 03 යි.)

(ii) සොකරි නාටකයේ අනුරූපණ අවස්ථා **දෙකක්** උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) සොකරි හා කෝලම් රංග ශෛලි සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

3. (i) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය රඟ දක්වන ප්‍රධාන ස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය විකාශනය වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍යයක රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

### B කොටස

4. (i) සංස්කෘත නාට්‍ය කලාවේ එන අර්ථෝපක්ෂේප නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)

(ii) අර්ථෝපක්ෂේප සියල්ල නම් කරන්න. (ලකුණු 05 යි.)

(iii) නාට්‍යමය උපක්‍රමයක් ලෙස අර්ථෝපක්ෂේපවල වැදගත්කම උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි.)

5. (i) අභිඥානශාකුන්තලයේ ඉතා ම රසවත් අංකය ලෙස විචාරකයන් හඳුන්වන්නේ කවර අංකය ද? (ලකුණු 02 යි.)

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ අංකය එසේ සලකනු ලැබීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඉහත (i) හි සඳහන් කළ අංකයේ ඔබ සිත් ගත් අවස්ථාවක් පිළිබඳ විචාරයක් කරන්න. (ලකුණු 07 යි.)

6. (i) කුවේණි නාට්‍යයේ රංග ශෛලිය කෙටියෙන් විවරණය කරන්න. (ලකුණු 02 යි.)

(ii) ගායක පිරිස කුවේණි නාට්‍යයේ විකාශනය පිණිස ඉටු කරන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ජීවහත්ත සහ දිසාලාගේ ගායනාවලින් නාට්‍යකරුවා ප්‍රකාශ කිරීමට අදහස් කරන්නේ කුමක් දැ යි නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**
* A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

1. (i) නාට්‍යයක චරිතයක් නිරූපණය කිරීම සඳහා පුහුණුවීම් ආරම්භයේ සිට වේදිකා ප්‍රවේශය දක්වා නළුවකුගේ සූදානමේ පියවර අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)
   (ii) හොඳ නළුවකු විසින් නිපුණ කළ යුතු කුසලතා **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) ක්ෂණික නිරූපණය ප්‍රගුණ කිරීම නළුවකුට වැදගත් වන්නේ මන් දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

2. (i) චරිතයක් අංගරචනා කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා දැ යි කෙටියෙන් පහදන්න. (ලකුණු 03 යි.)
   (ii) නාට්‍යයේ තේමාවට අදාළ සමාජ–සංස්කෘතික පරිසරය නිරූපණය කිරීමෙහි ලා පසුතල නිර්මාණයේ දායකත්වය විමසන්න. (ලකුණු 06 යි.)
   (iii) නාට්‍ය නිෂ්පාදනයක වේශභූෂණ හා රංගාලෝකය අතර පවතින සබඳතාව කවරාකාර දැ යි සාකච්ඡා කොට දක්වන්න. (ලකුණු 06 යි.)

3. (i) ග්‍රීක නාට්‍ය රඟ දැක්වූ එළිමහන් රංගභූමියක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 03 යි.)
   (ii) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයක රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයක ගායන වෘන්දයේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

### B කොටස

4. (i) සොෆොක්ලීස්ගේ ඊඩිපස් රජ නාට්‍යයට පාදක වූ පුරාවෘත්තය පදනම් ව රචනා වුණු වෙනත් නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) ඊඩිපස් රජ නාට්‍යය හෝ ඉහත (i) හි නම් කළ නාට්‍යයක් ඇසුරින් ක්‍රියොන්ගේ චරිතය විමර්ශනය කරන්න. (ලකුණු 05 යි.)
   (iii) ශෝකාත්ම නාට්‍ය රචනයෙහි ලා සොෆොක්ලීස්ගේ නිර්මාණාත්මක පරිණත බව ඔබ කැමති ඔහුගේ නාට්‍යයක් ඇසුරින් විමසන්න. (ලකුණු 08 යි.)

5. (i) ජූලියස් සීසර් නාට්‍යයේ පෝෂියා හා බෲටස් අතර සංවාදයෙන් අනාවරණය වන පෝෂියා ගේ චරිත ලක්ෂණ **දෙකක්** මතුකොට දක්වන්න. (ලකුණු 02 යි.)
   (ii) ඉහත (i) හි සංවාදයේ බෲටස් පෝෂියා ගැන සිතන්නේ කුමන අයුරකින් ද? කරුණු **තුනක්** යටතේ පහදන්න. (ලකුණු 06 යි.)
   (iii) ජූලියස් සීසර් නාට්‍යයේ පෝෂියා හා රූකඩ ගෙදර නාට්‍යයේ නූවුරා අතර සමාන අසමානතා කරුණු **දෙකක්** උපයෝගී කරගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

6. (i) රූකඩ ගෙදර නාට්‍යයේ විකාශනය සඳහා නාට්‍යකරුවා කාග්ස්ටාඩ් සහ හෙල්මර් ගේ චරිත අතර ඝට්ටනය කෙසේ දායක කොටගෙන තිබේ ද? විමසන්න. (ලකුණු 05 යි.)
   (ii) නූවුරාගේ අතීතය අනාවරණයෙහි ලා ලින්ඩේ සහ කාග්ස්ටාඩ් යන චරිත දායක වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)
   (iii) නාට්‍යාවසානයේ නූවුරා සිය කුටුම්බය හැර යන්නේ කවරාකාර අවබෝධයකින් දැ යි ඔබ සිතන්නේ ද? පහදන්න. (ලකුණු 05 යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න